# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අංක 2,352 - 2023 සැප්තැම්බර් මස 27 වැනි බදාදා - 2023.09.27

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී.)


## II කොටස – අධිකරණ

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙන පිටු අංක යොදා ඇත.)


| | පිටුව |
|---|---|
| සම්මත වූ පනත් ... ... ... ... | — |
| පනත් කෙටුම්පත් ... ... ... ... | — |
| ශ්‍රේෂ්ඨාධිකරණයේ දැන්වීම් ... ... ... ... | — |
| ශ්‍රී ලංකා ඇපැල් උසාවියේ දැන්වීම් ... ... ... | — |
| ශ්‍රේෂ්ඨාධිකරණයේ අපරාධ නඩු සැසි පිළිබඳ නිවේදන ... | — |
| දිසා අධිකරණ හා මහෙස්ත්‍රාත් අධිකරණ දැන්වීම් ... | — |
| වස්තු භංගත්ව නඩු පිළිබඳ දැන්වීම් ... ... ... | — |
| පිස්කල් මාර්ෂල්වරුන්ගේ පත් කිරීම් ... ... ... | — |
| පිස්කල් විකිණීම් ... ... ... | 564 |
| මුදල් නඩු පිළිබඳ දැන්වීම් ... ... ... ... | — |
| නීති අධ්‍යාපන සභාවේ දැන්වීම් ... ... ... | — |
| නොතාරිස් ලැයිස්තු ... ... ... ... | 566 |
| විවිධ දැන්වීම් ... ... ... ... | — |


*සැ. යු.*- ජාතික සමගිය සහ ප්‍රතිසන්ධානය සඳහා වන කාර්යාලය පනත් කෙටුම්පත, 2023 සැප්තැම්බර් මස 22 වැනි දින *ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ* II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළකරන ලදී.

**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

### වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයක ම මුල් සතියේ දී පළකරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළකිරීම සඳහා දැන්වීම් භාරගැනීම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාලවේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතු ය. නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි *ගැසට් පත්‍රය* පළ වූ දින සිට තෙමසකට පසුව භාරගනු නොලැබේ.

*ගැසට් පත්‍රයේ* පළකරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනට සති දෙකකට පෙර (එනම්, 2023 ඔක්තෝබර් මස 20 වැනි දින පළකරන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2023 ඔක්තෝබර් මස 06 වැනි දින දහවල් 12.00 ට හෝ ඊට පෙර) තැපෑලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

**206 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගනුදෙනු පනත - 9 වැනි වගන්තිය**

''යම් ප්‍රකාශනයක්, රීතියක්, නියෝගයක්, නියමයක්, අතුරු ව්‍යවස්ථාවක්, නිවේදනයක් හෝ වෙනත් කිසිවක් *ගැසට් පත්‍රයේ* පළකළ යුතු බවට යම් පනතකින් හෝ නීති ප්‍රඥප්තියකින් විධිවිධාන සලස්වා ඇති අවස්ථාවක, ඒ රීතිය, නියෝගය, නියමය, අතුරු ව්‍යවස්ථාව, නිවේදනය හෝ වෙනත් දෙය ඉලෙක්ට්‍රොනික ස්වරූපයේ වන *ගැසට් පත්‍රයක* පළ කරනු ලැබුවහොත් ඒ විධිවිධානය සම්පූර්ණ කර ඇත්තාක් සේ සැළකිය යුතු ය.''

**ගංගානි ලියනගේ,**
රජයේ මුද්‍රණාලයාධිපති.

2023 ජනවාරි මස 02 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

මෙම *ගැසට් පත්‍රය www.documents.gov.lk* වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

# පිස්කල් විකිණීම්

## ගම්පහ දිසා අධිකරණයේ දී ය

පිස්කල් වෙන්දේසියේ විකිණීමයි

වර්ණකුලසූරිය උපාලි ඇම්බ්‍රෝස් දාබරේරා,
මෙපල්ස් පාර, උල්හිටියාව, වෙන්නප්පුව.

.....................පැමිණිලිකරු.

නඩු අංකය : 94/MB
ස්වභාවය : උකස්
කාර්යපටිපාටිය : සාමාන්‍ය
වටිනාකම : රු. 7,000,000
ගම්පහ දිසා අධිකරණ ඇස්කීසි අංක : 37/22

*එදිරිව*

කොස්වත්තගේ ඇලෝෂියස් පෙරේරා,
අංක 512/1, නැදුන්ගමුව පාර, වැලිවේරිය,

............................විත්තිකරු.

ඉහත අංක සඳහන් නඩුවෙන් මා හට නිකුත් කර ඇති අධිකාරි පත්‍රයට අනුව මෙම නඩුවේ විත්තිකරුට එරෙහි ව ඇතුළත් කර ඇති තීන්දු ප්‍රකාශය පරිදි පැමිණිල්ලේ ආයාචනයට අනුව පැමිණිලිකරුගේ වාසියට තීන්දු ප්‍රකාශ කර ඇති නමුත්, රු. 2,000,000 සහ එකී මුදලක් සඳහා මේ වනතෙක් එකතු වූ පොලිය රු. 4,400,000 ක මුදල සහ ඉහත සඳහන් සම්පූර්ණ මුදල ගෙවා අවසන් වන තුරු රු. 2,000,000 ක මුදලට අදාළ වාර්ෂිකව 60% බැගින් වූ පොලිය විත්තිකරුගෙන් පැමිණිලිකරුට අය කර ගැනීමට නියෝග කර ඇති අතර, එකී ගෙවීම් කිරීමට විත්තිකරු අපොහොසත් වී ඇති හෙයින්, පහත උපලේඛනයේ විස්තර වන දේපළ **වර්ෂ 2023 ක් වූ නොවැම්බර් මස 09 වැනි දින ප.ව. 2.00** ට විත්තිකරුගේ දේපළ පිහිටි ස්ථානයේ දී මා විසින් පිස්කල් වෙන්දේසියේ විකුණනු ලැබේ.

*ගෙවීමේ ක්‍රමය*.- එකී වෙන්දේසියේ දී ඉහලම ලංසු තබන්නා ගැණුම්කරු වන අතර වෙන්දේසිය අවසන් වූ වහාම ගැණුම්කරු විසින් මුළු ගැණුම් මිලෙන් සියයට විසි පහක (25%) මුදලක් ද, පිස්කල් ගාස්තු, රජයට අය විය යුතු ගාස්තු, තක්සේරු ගාස්තු, වෙන්දේසි ගාස්තු *ගැසට්* පත්‍රයේ සහ පුවත්පත්වල ප්‍රසිද්ධ කිරීමේ වියදම් සහ අනෙකුත් ප්‍රචාරක කටයුතු සඳහා වූ වියදම් එවලේ ම මුදලින් මා වෙත ගෙවිය යුතුය. චෙක්පත් භාර ගනු නොලැබේ. ගැණුම් මිලෙන් සියයට හැත්තෑ පහක (75%) ඉතිරි මුදල දින 30 ක් ඇතුලත ගම්පහ දිසා අධිකරණයේ ඉහත අංක දරන නඩුවට තැන්පත් කළ යුතුය.

*දේපළට ප්‍රවේශ වන මාර්ගය*.- වැලිවේරිය ලංකා බැංකුව ඉදිරියේ ඇති නැදුන්ගමුව පාරේ ඉදිරියට ගිය පසු අංක 512/1 දරන දේපළ පාරේ දකුණු පස පිහිටා ඇත.

### උපලේඛනය

බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ, ගම්පහ ඉඩම් ලියාපදිංචි කිරීමේ කොට්ඨාශයට අයත්, සියනෑ කෝරළයේ, මැද පත්තුවේ, නැදුන්කමවත්ත නමැති ඉඩමේ දෙල්ගහවත්ත නමැති ඉඩමට එල්. ජේ. ලියනගේ බලයලත් මානක තැන වර්ෂ 1977.08.31 වැනි දින මැන සාදන ලද අංක 2306 දරන පිඹුර ප්‍රකාර බෙදා වෙන් කරන ලද ලොට් අංක 02 දරන කොටසට මායිම් : උතුරට : මෙම ඉඩමේ ලොට් අංක 01 දරන කොටස ද, දකුණු - නැගෙනහිරට : පාර ද, උතුරු - බස්නාහිරට, පාර ද, දකුණු - බස්නාහිරට : ඇලෝසියස් වික්‍රමරත්න යන අය විසින් අයිතිවාසිකම් කියන නමුත් දැනට ටී. ලෙසර්ස් පෙරේරාට හිමි ඉඩම ද, යන මෙකී මායිම් තුළ පිහිටි පර්චස් විසි දෙකයි දශම පහ (පර්. 22.5) ක් විශාල ඉඩමේ බිම සහ ඊට අයත් ගහකොළ, පලතුරු ආදී සෑම සියලු දේත් වේ.

මෙම ඉඩම ගම්පහ ඉඩම් රෙජිස්ට්‍රාර් කාර්යාලයේ වෙළුම් අංක ඊ 188/31 හි ලියාපදිංචි කර ඇත.

රෙජිස්ට්‍රාර්/නියෝජ්‍ය පිස්කල්,
දිසා අධිකරණය,
ගම්පහ.

වර්ෂ 2023 ක් වූ සැප්තැම්බර් මස 21 දින දී ය.

09-500

## රත්නපුර දිසා අධිකරණයේ දී ය

## පිස්කල් වෙන්දේසියේ විකිණීමේ දැන්වීමයි

කොළඹ, චිත්තම්පලම් ඒ. ගාඩිනර් මාවතේ, අංක 75 දරන ස්ථානයේ ප්‍රධාන කාර්යාලය පිහිටි සහ කුරුවිට යන ස්ථානයේ ශාඛා කාර්යාලයක් පවත්වාගෙන යනු ලබන මහජන බැංකුව.

.........................*පැමිණිලිකරු.*

නඩු අංක - 38227
ස්වභාවය - මුදල්
වටිනාකම - රු.484,803.14
ක්‍රියාපටිපාටිය - සාමාන්‍ය

*එදිරිව*

1. මනතුංග මුදියන්සේලාගේ අසේල චන්ද්‍රසිරි මනතුංග, අංක 658, උඩකඩ පාර, කුරුවිට.
2. සමරකෝන් ජයසුන්දර මුදියන්සේලාගේ සමන් මධුශංක, අංක 41, සොරබොර වැව පාර, කුඹුක්ගොල්ල, මහියංගනය.
3. බටුගෙදර දවිතාලාගේ මහේෂ් ආනන්ද බටුගෙදර, අංක 424/ඒ/05, එල්ලාවල පහලගම, ඇහැළියගොඩ.

.........................*විත්තිකරුවන්.*

රත්නපුර දිසා අධිකරණයේ විභාග වූ ඉහත අංක දරන නඩුවේ 2022 ජනවාරි 24 වැනි දින දරන සමථ තීන්දුව පරිදි ඉහත නම් සඳහන් පළමු විත්තිකරු විසින් පැමිණිලිකාර ආයතනයට ගෙවිය යුතු බවට නියම කරන ලද මුදල වන රු. 532,256.29 ක මුදල හා ඇස්කීසි වියදම් නොගෙවීම නිසා එය අයකර ගැනීම සඳහා නිකුත් කරන ලද ඇස්කීසියේ බලය පිට මා විසින් 2022.12.21 දින තහනමට ගන්නා ලද පහත සවිස්තරව දක්වා ඇති භාණ්ඩ, තහනමට ගන්නා ලද ස්ථානය වන 1 විත්තිකරු වන මනතුංග මුදියන්සේලාගේ අසේල චන්ද්‍රසිරි මනතුංග, අංක 658, උඩකඩ පාර, කුරුවිට යන ලිපිනයේ දී **2023 ක් වූ ඔක්තෝබර් 27 වන දින පෙ.ව. 11.30** ට ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණන බවට මෙයින් දැනුම් දෙනු ලැබේ.

*භාණ්ඩ විස්තරය :*

| | | | |
|---|---|---|---|
| 1. | සැම්සුන් වර්ගයේ අඟල් 32 රූපවාහිනි | - | 1 |
| 2. | ටී. වී. ස්ටෑන්ඩ් | - | 1 |
| 3. | ප්ලාස්ටික් ඇඳි පුටු | - | 6 |
| 4. | ස්ටූලය සමඟ ලී පුටු සෙට් | - | 1 |
| 5. | Hisense වර්ගයේ ශීතකරණ | - | 1 |
| 6. | පිත්තල මල් බඳුන් | - | 1 |
| 7. | සිංගර් මහන මැෂින් (ක්‍රියා විරහිත) | - | 1 |
| 8. | වානේ අල්මාරි | - | 3 |
| 9. | ස්ටෑන්ඩ් ෆෑන් | - | 4 |
| 10. | දොර දෙක ලී අල්මාරි | - | 1 |
| 11. | දොර එක ලී අල්මාරි | - | 1 |
| 12. | ලී රාක්ක | - | 1 |
| 13. | මහන මැෂින් (ක්‍රියාවිරහිත) | - | 1 |
| 14. | දොර දෙක වානේ අල්මාරි | - | 1 |
| 15. | දොර තුන වානේ අල්මාරි | - | 1 |
| 16. | මේස විදුලි පංකා | - | 1 |
| 17. | කණ්නාඩි මේස | - | 1 |

එච්. පී. සී. ජී. හේවාවසම්,
රෙජිස්ට්‍රාර්/නියෝජ්‍ය පිස්කල්,
දිසා අධිකරණය - රත්නපුර.

2023 සැප්තැම්බර් මස 06 වැනි දින,
රත්නපුර දිසා අධිකරණයේ දී ය.

09-597

# නොතාරිස් ලැයිස්තුව

## රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය

107 අධිකාරය වන නොතාරිස් ආඥපනත

රත්නපුර මහාධිකරණ කලාපය තුළ සිංහල භාෂාවෙන් නොතාරිස් ධුරයේ කටයුතු කළ කලහෙ පතිරණලාගේ සිරිල් පතිරණ මහතාගේ 2023.03.01 දින සිට ධුරයෙන් ඉල්ලා අස්වීම රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යතුමා විසින් අනුමත කර ඇති බව මෙයින් සහතික කරමි.

කේ. ඩී. එන්. රංජිත් අශෝක,
ලේකම්,
රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා
හා පළාත් පාලන අමාත්‍යාංශය.

2023 සැප්තැම්බර් මස 07 වැනි දින,
කොළඹ.

09-508

---

## රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය

107 අධිකාරය වන නොතාරිස් ආඥපනත

කෑගල්ල මහාධිකරණ කලාපය තුළ සිංහල හා ඉංග්‍රීසි භාෂාවලින් නොතාරිස් ධුරයේ කටයුතු කළ රණසිංහ වියලියගොඩ මුදලිගේ කිංස්ලි පෙරේරා මහතාගේ 2023.03.01 දින සිට ධුරයෙන් ඉල්ලා අස්වීම රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යතුමා විසින් අනුමත කර ඇති බව මෙයින් සහතික කරමි.

කේ. ඩී. එන්. රංජිත් අශෝක,
ලේකම්,
රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා
හා පළාත් පාලන අමාත්‍යාංශය.

2023 සැප්තැම්බර් මස 07 වැනි දින,
කොළඹ.

09-509

---

## රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය

107 අධිකාරය වන නොතාරිස් ආඥපනත

කළුතර මහාධිකරණ කලාපය තුළ සිංහල හා ඉංග්‍රීසි භාෂාවලින් නොතාරිස් ධුරයේ කටයුතු කළ ඩැනිස්ටර් ඕවන් ද මෙල් මහතාගේ 2023.03.01 දින සිට ධුරයෙන් ඉල්ලා අස්වීම රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යතුමා විසින් අනුමත කර ඇති බව මෙයින් සහතික කරමි.

කේ. ඩී. එන්. රංජිත් අශෝක,
ලේකම්,
රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා
හා පළාත් පාලන අමාත්‍යාංශය.

2023 සැප්තැම්බර් මස 07 වැනි දින,
කොළඹ.

09-510

**රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය**

107 අධිකාරය වන නොතාරිස් ආඥාපනත

කෑගල්ල මහාධිකරණ කලාපය තුළ සිංහල භාෂාවෙන් නොතාරිස් ධුරයේ කටයුතු කළ දහනායක රාලලාගේ නිර්මලා ප්‍රියදර්ශනී මහත්මියගේ 2022.08.31 දින සිට ධුරයෙන් ඉල්ලා අස්වීම රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යතුමා විසින් අනුමත කර ඇති බව මෙයින් සහතික කරමි.

කේ. ඩී. එන්. රංජිත් අශෝක,
ලේකම්,
රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා
හා පළාත් පාලන අමාත්‍යාංශය.

2023 සැප්තැම්බර් මස 07 වැනි දින,
කොළඹ.

09-511

---

**රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය**

107 අධිකාරය වන නොතාරිස් ආඥාපනත

බලපිටිය මහාධිකරණ කලාපය තුළ සිංහල භාෂාවෙන් නොතාරිස් ධුරයේ කටයුතු කළ පුන්‍යසිරි ගුණපාල විජයවර්ධන මහතාගේ 2023.02.01 දින සිට ධුරයෙන් ඉල්ලා අස්වීම රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යතුමා විසින් අනුමත කර ඇති බව මෙයින් සහතික කරමි.

කේ. ඩී. එන්. රංජිත් අශෝක,
ලේකම්,
රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා
හා පළාත් පාලන අමාත්‍යාංශය.

2023 සැප්තැම්බර් මස 07 වැනි දින,
කොළඹ.

09-512

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.